**කෘෂි නවීකරණ ව්‍යාපෘතිය**
விவசாய நவீனமயமாக்கல் திட்டம்
**Agriculture Modernization Project**

**THE WORLD BANK**
IBRD - IDA | WORLD BANK GROUP

# කෘෂිකර්ම අමාත්‍යාංශය

## කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය

## ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

## (උතුරු මැද පළාත)

Funded by
The European Union

ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනයේ මූල්‍ය ණය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් කුඩා ඉඩම් හිමි ගොවීන්ට තරඟකාරී හා අලෙවි කළ හැකි වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය කිරීමට, වෙළඳපළ අවශ්‍යතාවයන්, සැපයීමට හා වැඩි වර්ධනය කළ වාණිජකරණය වෙතට ගමන් කිරීමට ඔවුන් සතු හැකියාව වැඩිදියුණු කිරීමට සහාය වීම සඳහා දේශීය සහභාගීත්ව උපායමාර්ගයන්ට සමගාමීව කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉතිරි කාල සීමාව මාස 18ක් පමණ වන අතර, ව්‍යාපෘති ඇස්තමේන්තුගත පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 90.23 ක් වේ. ( ලෝක බැංකු ණය මුදල ඇ. ඩොලර් මිලියන 64.23 සහ යුරෝපා සංගමයේ ප්‍රදානය ඇ. ඩොලර් මිලියන 26.0)

උතුරු මැද පළාත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පහත සඳහන් තනතුරු පිරවීම සඳහා පහත දක්වා ඇති සුදුසුකම් හා පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් 2019.03.05 දිනැති අංක 01/2019 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛනය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. පළාත් කෘෂිකර්ම විද්‍යාඥ (PS - 3) තනතුරු 01 යි**

**02. පළාත් වැඩසටහන් නිලධාරී (PS – 6) තනතුරු 01 යි**

01. පළාත් කෘෂිකර්ම විද්‍යාඥ (PS -3)

**අවශ්‍ය සුදුසුකම්**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිමා කළ ප්‍රථම උපාධියක්
හෝ
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස පිළිගත් සුදුසුකමක්
හෝ
පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වයක් / සමාන වෘත්තීය සුදුසුකමක්
සමග
අවම වශයෙන් වසර 10 ක කළමනාකරණ මට්ටමේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද,

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිමා කළ ප්‍රථම උපාධියක්
හෝ
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස පිළිගත් සුදුසුකමක්
හෝ
පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වයක්/ සමාන වෘත්තීය සුදුසුකමක්
සහ
අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ ආයතනික / චරලත් සාමාජිකත්වය හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකම්
සමග
අවම වශයෙන් වසර 08 ක කළමනාකරණ මට්ටමේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද,

iii. දීපව්‍යාප්ත රාජ්‍ය සේවයේ 1 වන පන්තියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්වයක් දැරීම,
සමග
1 වන පන්තියේ තනතුරක අවම වශයෙන් වසර 03 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

**02. පළාත් වැඩසටහන් නිලධාරී (PS – 6) තනතුරු 01 යි**

**අවශ්‍ය සුදුසුකම්**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්,
හෝ
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන උපාධියට සමාන අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකමක්,
හෝ
වෘත්තීය ආයතනයක සාමාජිකත්වය / පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ ඊට සමාන වෘත්තීය සුදුසුකම් හෝ පිළිගත් ජාතික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් ලබාගත් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 7 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම, සහ අවශ්‍ය විශේෂඥ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්ද
හෝ

ii. තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ජාතික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් ලබාගත් NVQ 6 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම, සහ
අවශ්‍ය විශේෂඥ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර හතක (07) පළපුරුද්ද
හෝ

iii. තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ජාතික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් ලබාගත් NVQ 5 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම, සහ
අවශ්‍ය විශේෂඥ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දොළහක (12) පළපුරුද්ද

**පොදු කොන්දේසි :**

- විදේශ අරමුදල් සහිත ව්‍යාපෘතිවල සේවා පළපුරුද්ද අමතර සුදුසුකමක් වන අතර, ලෝක බැංකු අරමුදල් ලබන ව්‍යාපෘති නම් වඩාත් සුදුසුය.
- අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 64 ට නොවැඩි විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය** : සුදුසුකම් හා පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

**වැටුප් පරිමාණය** : 2019.03.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/ 2019 මත පදනම් වේ.

**සේවා නියුක්තියේ කොන්දේසි** : සියලුම පත්කිරීම් ඉහත කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/ 2019 ට අනුකූලව සිදු කෙරේ.

**අයදුම්පත්** : තම ජීව දත්ත ඇතුළත් අයදුම්පත්, සහතික පිටපත් හා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග 2023 අගෝස්තු මස 21 දිනට හෝ ඊට පෙර ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. රාජ්‍ය / අර්ධ රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් තම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

- අයදුම් කරන තනතුර අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

**ලේකම්**
**කෘෂිකර්ම අමාත්‍යාංශය,**
**කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය,**
**අංක : 123/2, පන්නිපිටිය පාර, බත්තරමුල්ල.**